# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2131/39 – 2019 ජූලි 11 වැනි බ්‍රහස්පතින්දා – 2019.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මයුරාවතී කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 1093, ඉහළ මුරුතැංගේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මුරුතැංගේ (අ.ග.පි. 14) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේයූ/කේපීඊ/2017/627 හා 2018.09.25 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කන්දෙකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0411**

උතුරට: ඒ. එම්. අනුලා හේමමාලි අමරසිංහ හිමිකම් කියන කන්දෙකුඹුරපිල්ලෑව; නැගෙනහිරට: ඒ. එම්. ආරිය කල්‍යාණවතී හිමිකම් කියන තිඹිරිගහමුලවත්ත; දකුණට: ඒ. එම්. ආරිය කල්‍යාණවතී හිමිකම් කියන තිඹිරිගහමුලවත්ත සහ ඩබ්ලිව්. ජී. චම්පා කුමුදුනී හිමිකම් කියන මාදංගොල්ලවත්ත; බටහිරට: ඩබ්ලිව්. ජී. චම්පා කුමුදුනී හිමිකම් කියන මාදංගොල්ලවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2017/පීසී/223.
2019 මැයි මස 29 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 871



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*